# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1856/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 16/12/2024 පැය 1600

# මාධ්‍ය නිවේදනය

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.12.15 වන දින උදැසන කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ඩිමෙල්වත්ත ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 270 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වන ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**0 2. මාරක රිය අනතුරක් - වැල්ලම්පිටිය පොලිස් වසම.**

2024.12.15 වන දින දහවල් කාලයේ වැල්ලම්පිටිය පොලිස් වසමේ අවිස්සාවේල්ල කොළඹ ප්‍රධාන මාර්ගයේ කුඩා බුත්ගමුව ප්‍රදේශයේදී කොළඹ දෙස සිට අවිස්සාවේල්ල දෙසට ධාවනය වූ බස් රථයක එම දිසාවටම ධාවනය වූ යතුරුපැදියක් ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පසු පැදිකාරිය කොළඹ ජාතික රෝහලට කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 48 ක් වූ කැළණිමුල්ල, අංගොඩ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීර කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මාරක රිය අනතුරක් - මිනුවන්ගොඩ පොලිස් වසම.**

2024.12.15 වන දින අළුයම් කාලයේ මිනුවන්ගොඩ පොලිස් වසමේ මිනුවන්ගොඩ දූනගහ මාර්ගයේ නිල්පනාගොඩ ප්‍රදේශයේදී පුද්ගලයෙකු

වාහනයක ගැටීමෙන් තුවාල ලබා මිනුවන්ගොඩ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත. අනතුරෙන් පසු සැකකරු පලා ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 40 ක් වූ බුරුලපිටිය, මිනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීර මිනුවන්ගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ සැකකරු හා වාහනය සොයා මිනුවන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**